# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,659 — 1959 පෙබරවාරි 6 වැනි සිකුරාද — 6.2.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 299 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 301 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 302 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 308 | විවිධ දැන්වීම් ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායඩ් සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.


299—ජේ. ඇන්. බී. 11291—5,910 (1/59)

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/3/5(ජී).

## මධ්‍ය ලිපිකාර විභාගය—1958 වේ පෙබරවාරි

වර්ෂ 1958 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 11,564 සහ 1958 නොවැම්බර් 14 වැනි දින අංක 11,584 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පිළිවෙලින් පළ කරන ලද 1958 ඔක්තෝබර් මස 21 වැනි දින සහ 1958 නොවැම්බර් 11 වැනි දින දරන නිවේදන හා සම්බන්ධයි.

වර්ෂ 1958 පෙබරවාරි මස පවත්වනු ලැබූ මධ්‍ය ලිපිකරු විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් ද සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියට පත් කිරීමට තෝරා ගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | ලිපිනය |
|---|---|
| අබ්දුල් බුහාරි, එම්. එච්. ... | ආණ්ඩුවේ ගුරු අභ්‍යාස විද්‍යාලය, අට්ටාලච්චේනෙයි. |
| අබයවර්ධන, එස්. පී. ද එස්. | 288, කොළඹ පාර, මීගොමුව. |
| අයියම්පිල්ලේ, කේ. ... | නාපන් කුලම්, ඕමන්තෙයි. |
| ආරුමුගම්, කේ. එස්. ... | මාතලේ/ආණ්ඩුවේ දෙමළ පාසැල, රත්තොට. |
| ආරියපාල, එම්. ඒ. ... | බදුල්ල/උඩුවර රජයේ පාසැල, හාලිඇළ. |
| ආරියවංශ, ටී. එම්. ජේ. ... | හලාවත/මහවැව ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ මිශ්‍ර පාසැල, මහවැව. |
| කරුණාරත්න, පී. කේ. ඩී. | ගම්සභා කායාලය අසල, තංතිරිමුල්ල, පානදුරේ. |
| කුමාරදාස, එච්. එම්. ... | කුරුණෑගල/වැල්ලරාව රජයේ මිශ්‍ර පාසැල, බිංගිරිය. |
| කුමාරසාමි, ඒ. ... | මන්නාරම/වන්නමෝඩ්ඩෙයි ආණ්ඩුවේ දෙමළ මිශ්‍ර පාසැල, උයිලන්කුලම. |
| කුඤ්ඤා, එම්. එස්. ... | ගම්මුලාදෑනි තැන, තලෙයිමන්නාරම. |
| කිඩ්ඩිනන්, එස්. ... | "සාන්ත තෝට්ටම්", අවරන්කල්, පුත්තූර්. |
| කිරිමුදියන්සේ, එස්. බී. ඒ. එම්. | බිංගිරිය. |
| ක්‍රිෂ්ණවේල් ගුරුමූර්ති, එන්. | පී. නල්ලෙයිනාදන් මහත්මිය බාරේ, උරුම්පිරෙයි උතුර, උරුම්පිරෙයි. |
| ගුණවර්ධන, ආර්. පී. ... | උඩත්තාපොල, දෙඩම්ගස්ලන්ද. |
| ගුණසේකර, එච්. එම්. ... | තෝරබිච්චිය, ඉලුක්හේන. |
| ජයකොඩි, එල්. කේ. ... | සියඹලාපිටිය, මාකෙවිට, ජාඇල. |
| ජයතිස්ස, එම්. ජී. ... | උඩගම, අටබාගේ. |
| ජයසිංහ, එස්. ... | රත්නපුර/ඇලපාත ආණ්ඩුවේ මිශ්‍ර පාසැල, රත්නපුරය. |
| ජයසේකර, ජේ. ... | කුරුණෑගල/මැද්දේගම ආණ්ඩුවේ මිශ්‍ර පාසැල, වැල්ලව. |
| ඩේවිඩ්, ඩබ්ලිව්. ... | පහල බෙලිගල්ල, බෙලිඅත්ත. |
| දේවසුරේන්ද්‍ර, එස්. ... | දබරල්ල පාසැල, කාරියමඩිත්ත. |
| නිමෙල්, අයි. ඩී. ... | උණගස් වෙල, වතුගෙදර. |
| පියදාස, ආර්. ජී. ... | පැල්ලැපිටිය, උඩහේන්තැන්න. |
| පියදාස, එච්. ජී. ... | ගාල්ල/උඩුගම රජයේ දෙටු පාසැල, උඩුගම. |
| පුංචිබණ්ඩා, ඩී. එම්. ... | ඔබ්බේගොඩ පාසැල, මොණරාගල. |
| පෙරේරා, එච්. එස්. ... | එෆ්. ඒ. ශාඛාව, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ 1. |
| බන්දුල, එන්. සී. ... | ගාල්ල/කරුවල බැද්ද රජයේ මිශ්‍ර පාසැල, මීටියාගොඩ. |
| මයිකල් සිංඤෝ, ඊ. ... | සී. ගුණවර්ධන මහත්මිය බාරේ, අංක 29, උයන, මොරටුව. |
| රත්නායක, අන්ද්‍රයස් ... | කණ්ඩිය ළඟ, වේපතඉර, හක්මන. |
| රත්නායක, ආර්. ඒ. ඒ. ... | කුරුණෑගල/බෝදිමුල්ල ආණ්ඩුවේ සිංහල මිශ්‍ර පාසැල, මගුලාගම. |
| රන්බංඩා, එච්. එම්. ... | "මැදකුඹුරවත්ත", ලේනව, මැල්සිරිපුර. |
| ලොකු අප්පුහාමි, ජී. බී. ... | එච්. ඒ. පුන්චි මැණිකා මහත්මිය බාරේ, කෝම්පිටිය, ගොඩකවෙල. |
| වික්‍රමසිංහ, පී. එන්. ජේ. ... | නුවර/බෙරවිල ආණ්ඩුවේ සිංහල මිශ්‍ර පාසැල, පට්ටිතලාව, දෙලොස්බාගේ. |
| වික්‍රමසිංහ, ශ්‍රී. ... | කහටගස්තැන්න, රුවන්වැල්ල. |
| විජේවර්ධන, ඩබ්ලිව්. ආර්. ... | උඩවෙල මිශ්‍ර පාඨශාලාව, ඕපනායක. |
| විජේසේකර, ඩබ්ලිව්. එම්. | ගමාච්චිගේ වත්ත, පල්ලොල්පිටිය, තිහගොඩ. |
| විමලසිරි, ඊ. එච්. ... | 353, උඩහමුල්ල, නුගේගොඩ. |
| විමලසිරි, ඩබ්ලිව්. ඒ. ... | 112 ඒ., වාරිමාගී නිවාස, රත්මලාන. |
| වීරසිංහ, ටී. එම්. ... | දුම්බුලුව, ගලපිටමඩ. |
| වීරසේකර, එම්. එම්. ... | ගවරම්මාන, කැප්පිටිපොල. |
| සොමනෝරිස් හාමි, ටී. ඒ. | මිනින්දෝරු කායාලයය, තැ. පෙ. 506, කොළඹ. |
| සෝමනාදන්, එස්. ... | ආණ්ඩුවේ දෙමළ මිශ්‍ර පාසැල, උඩුගොඩ. |
| සෝමපාල, එම්. කේ. ඩී. ... | ඉඩම් ලියාපදිංචි කිරීමේ කායාලය, මීගොමුව. |
| සෝමරත්න, එම්. ... | කෑගල්ල/පනාවල ජ්‍යෙෂ්ඨ පාඨශාලාව, ඇහැළියගොඩ. |
| හමීඩ්, ඒ. සී. එස්. ... | උපාචාර්ය, කෑගල්ල/ගරාගොඩ රජයේ මුස්ලිම් මිශ්‍ර පාසැල, යටියන්තොට. |
| හරමානිස්, ජී. ජී. ... | ඔවිස, පූජාපිටිය. |
| හේමචන්ද්‍ර, ඊ. වී. ... | ගාල්ල/බටේමුල්ල ආණ්ඩුවේ මිශ්‍ර පාඨශාලාව, ඉමදූව. |
| හේරත් බණ්ඩා, එච්. එම්. | පල්ලේගණේ, පලාපත්වෙල, මාතලේ. |

2. මේ අපේක්ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. නමුත්, ඇබෑර්තු ඇතිවන විට, ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර, වෛද්‍ය පරීක්ෂණයකට සහ සාමාන්‍ය ලිපිකරු සේවයේ කොන්දේසි වලට යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1959 ජනවාරි 30 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

---

## කො/ඇන්ඩර්සන් පාරේ පිහිටි රජයේ මහා විද්‍යාලය (කළුබෝවිල)

### 1959 වර්ෂයේ ශිෂ්‍යයන් බඳවාගැනීම

රජයේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාඨශාලාවක් දෙහිවල ඇන්ඩර්සන් පාරේ ආරම්භ කිරීමට යෝජනාකොට තිබේ. එය ආරම්භකරනු ලබන්නේ 1959.2.9 වැනි දිනදීය. ඊට ශිෂ්‍යයන් බඳවාගැනීම බාලාංශ පංක්තිවලට පමණක් දැනට සීමා කරනු ලැබේ. සවකීය ළමයින් මෙම පාඨශාලාවට ඇතුළත්කිරීමට අදහස් කරන දෙමාපියන් විසින් 1959.2.5 දින හෝ ඉන් පසුව පහත පෙනෙන ලිපිනයට යැවිය යුතුයි.

විද්‍යාලයාධිපතිතුමා,
කො/ඇන්ඩර්සන් පාරේ පිහිටි රජයේ මහා විද්‍යාලය,
කළුබෝවිල, දෙහිවල.

2. බාලාංශ පඩ්ක්තිවලට ඇතුළත්කිරීමට අදහස් කරන ශිෂ්‍යයන් පහත පෙනෙන වයස් සීමාවන්ට අයත් විය යුතුයි :—

(i) ප්‍රථම වර්ෂ පඩ්ක්ති (පහළ බාලාංශය) අවුරුදු 4 මාස 6 සිට අවුරුදු 5 මාස 6 දක්වා.

(ii) ද්විතීය වර්ෂ පඩ්ක්ති (ඉහළ බාලාංශය) අවුරුදු 5 මාස 6 සිට අවුරුදු 6 මාස 6 දක්වා.

(iii) තෘතීය වර්ෂ පඩ්ක්ති (2 වන ප්‍රමාණය) අවුරුදු 6 මාස 6 සිට අවුරුදු 7 මාස 6 දක්වා.

(පඩ්ක්ති පැවැත්වෙන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි)

3. දැනට පාඨශාලා පහසුකම් නොමැති ශිෂ්‍යයන් ගැනද පදිංචි ස්ථානයෙන් බැහැර ඈත පළාත්වල පිහිටි පාඨශාලාවලට ඇතුළත්වීමට සිදුවී ඇති අභිනව පාඨශාලාව පිහිටි ස්ථානයේ සිට සැතපුම් දෙකක් ඇතුළත පිහිටි ප්‍රදේශයේ පදිංචි ශිෂ්‍යයන් භාරගැනීම ගැනද විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. ශිෂ්‍යයන් ඇතුළත් කරගන්නා දිනයේදී දෙමාපියන් විසින් ළමයින්ගේ වයස පිළිබඳව පිළිගතහැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

ඩබ්ලිව්. ඈ. ඒ. වර්ණසූරිය,
අධ්‍යාපන නිලධාරි තැන, බ. ප.

අධ්‍යාපන කායාලය,
තර්ස්ටන් පාර,
කොළඹ—3,
1959.2.2.

14. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට අවශ්‍යයයි පෙනී ගියහොත් තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ වියදමින් ඇප කරුවන් එක් කෙනෙක් ලවා හෝ ඊට වැඩි ගණනක් ලවා හෝ පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානමින් සිටිය යුතුය. මෙම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ අය විය යුතුයි.

15. කොන්ත්‍රාත්තුවේ සඳහන් වැඩ අසතුටුදායක ලෙස කිරීම් නිසාත් කොන්දේසි ඉටු නොකිරීම නිසාත් කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන සතුවේ.

16. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයේ නම සඳහන් කෙනෙකු සමග හෝ එම අය හා එකතුව ඉදිරිපත් වන කෙනෙකු සමග හෝ රජයට නුසුදුසු යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ

17. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුනහොත් නැතහොත් ඔහු විසින් සපයා ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ එම ස්ථානයෙහි තැබුවහොත් එම දැන්වීම් ඔහුටම දුන් ලෙස සලකනු ලැබේ.

18. වැඩි විස්තර සඳහා අනුරාධපුරයේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ලියා විමසිය යුතුයි. එසේ ලිවීමේදී රාජකාරි ලිපිනයට එවිය යුතුයි.

ආර්. ආර්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959යේ ජනවාරි මස 30 වැනිදා,
පේරාදෙණියේදීය.

---

## අලෙවි සංවර්ධනකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි සංවර්ධනකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන වීරිපොලි වෙළඳ සැලට 1959.1.3 සිට 1959.3.31 දක්වා ඇති කාලය තුලදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර 1959යේ පෙබරවාරි මස 16 වැනි සඳුදා අ. භා. 2.30 වන තෙක් කොළඹ යුනියන් ප්ලේස්හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කාර්යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි සංවර්ධනකිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ටෙන්ඩර ෆෝරම ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

1959යේ පෙබරවාරි මස 16 වැනි සඳුදා දවල් 12 වනතුරු ටෙන්ඩර ෆෝරම අලෙවි සංවර්ධනකිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි සංවර්ධනකිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවි සංවර්ධනකිරීමේ කොමසාරිස්තැන වෙනුවට.

1959යේ පෙබරවාරි 2 වැනි දින,
අලෙවි සංවර්ධනකිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 62, චැතැම් වීදිය, කොළඹ 1.

---

## දැන්වීමයි

ඌව පලාතේ ලිං සහ වැසිකිලි සෑදීම සඳහා ටැන්ඩර් පත්‍රිකා භාර ගන්නා බව සඳහන්, 1959 ජනවාරි මස 30 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකර තිබෙන මගේ ටැන්ඩර් දැන්වීම ගැනයි.

ටැන්ඩර් පත්‍රිකා ලබාගන්නට අදහස් කරන අය, එහි සඳහන් එක් එක් වැඩය සඳහා රුපියල් 100 නොව රුපියල් 10 ඇප මුදලක් පමණක් තැන්පත් කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

ජී. නාගොඩ විතාන,
ඌ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1959.1.29.
බණ්ඩාරවෙල, ඌ. ප.
අධ්‍යාපන කාර්යාලයේදීය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැන විසින් 1959.2.27 දින පෙරවරු 9.30 දක්වාද පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| පාසැලේ නම | වැඩ විස්තර |
|---|---|
| 1. බදි/මැදගම ජ්‍යෙෂ්ඨ පාඨශාලාව | අළුත් වැසියා |

සංක්ෂෙපය : බදි=බදුල්ල දිස්ත්‍රික්කය.

2. අංක 1 සඳහා රු. 10,000 ඉහළ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1 සඳහා රු. 20,000 ඉසළ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී., ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය සඳහා රු. 100 තැන්පත් කළ කුවිතාන්සියක් බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් 1959.2.26 පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තර බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයට ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාල සහකාර තැනට භාර දී, එසේ භාර ගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුළත් කවරය මත ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදී 1959.2.27 දින පෙරවරු 9.30 ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් ඇමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුල විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර්කරුවන් විසින් සේවය සඳහා බඳවා ගත හැක්කේ එම වැඩ කරන ප්‍රදේශයේ පදිංචි පුහුණු හෝ, නුපුහුණු ලාංකික කම්කරුවන් පමණි. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත් කරුවන් කොන්දේසි කඩකළවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශේෂ හේතුන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂක් තැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා සමග සාකච්ඡාකොට, ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් යෙදවීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නොමැතිව එවැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් හෝ යෙදවීම තහනම්ය.

8. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම්කරන අවස්ථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ දිනය | කොන්ත්‍රාත්තුවේ මුදල ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය කල් දීම ඇතිව | වැඩය සතුටුදායකද අසතුටුදායකද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධාන තැනගේ අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |

.........................
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය : ————.

9. ටෙන්ඩර්කරුවන් විසින් පූර්වෝක්ත (8) ඡේදයේ අසා තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍යය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගුකිරීමට ප්‍රමාණවත් වන බැව් සැලකිය යුතුයි.

ඊ. නාගොඩවිතාන,
ඌවේ අධ්‍යාපන නිලධාරිතැන.

අධ්‍යාපන කායාලය,
බන්ඩාරවෙල 29.1.59.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

මෙහි පහත සඳහන් වැඩ වෙනුවෙන් ටැන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන කායාලයේ ප්‍රථම මාලයේදී ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 පෙබරවාරි 27 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩෙහි විස්තර |
|---|---|
| ටී/තිරිකුණාමලේ ජ්‍යෙෂ්ඨ පාඨ ශාලාව | සාමාන්‍ය විද්‍යා පරීක්ෂණාගාර යක් |
| බීටී/තින්ද ඌර් ජ්‍යෙෂ්ඨ පාඨ ශාලාව | එම |
| බීටී/සායින්දමරදු ජ්‍යෙෂ්ඨ පාඨ ශාලාව | එම |
| බීටී/අම්පාරේ ජ්‍යෙෂ්ඨ පාඨශාලාව... | එම |

සංලක්ෂ්‍යය.—බීටී=මඩකලපු දිස්ත්‍රික්කය.
ටී=තිරිකුණාමල දිස්ත්‍රික්කය.

2. ටැන්ඩර් ෆෝර්ම 1959 පෙබරවාරි 26 වැනි දින පස්වරු 3.30 දක්වා ලබාගත හැකිය.

රුපියල් 20,000කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද එසේ නැතහොත් රුපියල් 40,000කට හෝ ඊට වැඩි ගණනකට ප්‍රසිධ වැඩ දෙපාර්තමේන්තුවේද ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අය විසින් එක් එක් වැඩය සඳහා රු. 100ක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒඒ. සී. ශාඛාවේ) හෝ? ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට රිසිට් පතක් නැගෙනහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තුමන් වෙත ඉදිරිපත් කළ විට ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් ආදිය භාර නොගනු ලැබේ.

3. දැනටමත්, රජයේ කොන්ත්‍රාත් වැඩ භාරගෙන ඒවායේ යෙදී සිටින ටෙන්ඩර් කරුවන් ඒ වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට එකී වැඩ කටයුතු භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ටැන්ඩර් ෆෝර්ම ඉල්ලීමේදී ඉදිරිපත් කළ යුතුයි.

සහතික පත්‍රය තිබිය යුත්තේ පහත පෙනෙන ෆෝර්මයේ අන්දමටය :—

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ මුදල | කොන්ත්‍රාත්තුවේ මුලු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය කල් දීම ඇතිව | වැඩය සතුටු දයකද අසතුටු දයකද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධාන තැනගේ අත්සන |
|---|---|---|---|---|---|

ඉහත සඳහන් වන්නේ මා භාරගෙන තිබෙන රජයේ සියලුම කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සම්පූර්ණ සටහනයි.

4. යම්කිසි කොන්ත්‍රාත්කරුවෙක් ටැන්ඩර් ෆෝර්ම ඉල්වා සිටීමේදී දැනට කරගෙන යන ඔහුගේ කොන්ත්‍රාත් වැඩ පිළිබඳ කරුණු ඕනෑකමින්ම සඟවතොත් ඔහුගේ කොන්ත්‍රාත්තුවේ කුමන අවස්ථාවකදී වුවත් එය අවලංගු කිරීමේ බලය රජය සතුව පවතී.

5. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීමට උවමනා බල කඩදාසි මඩකලපුවේ නැගෙනහිර පළාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කරන බලකඩදාසි නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදය යටතේ ඒ ඒ ප්‍රමාණවලට ලියාපදිංචි වූ බව ඔප්පු කළ හැකි අයට පමණක් බව දත යුතුය.

6. දෙවැනි ඡේදයේ ප්‍රකාර මඩකලපුවේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත හැකි ටැන්ඩර් ෆෝර්ම දෙවැනි පිටපතත් සමග ඉදිරිපත් කළ යුතුය. එතුමාගෙන් මේ පිළිබඳ සියලු විස්තර දැනගත හැකිය. එපමණක් නොව එම කායාලයේදී සැලැස්මවල්ද බැලිය හැක. තැපැල් මගින් එවන විට ටැන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදෙශීය ටැන්ඩර් ඉල්ලුම් කරුවන් ටැන්ඩර් පත්‍ර තැපෑලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කවරයෙහි පිට පැත්තේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙලද සේවයේ විස්තරද දක්වෙන, සීල් තබන ලද ටැන්ඩර් පත්‍ර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමන්ගේ කායාලීය සහකාර තැන වෙත භාර දී භාරදුන් බවට ලියවිල්ලක් එවේලේම ලබාගත යුතුයි.

7. ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන කායාලයේ ප්‍රථම මාලයේදී 1959 පෙබරවාරි 27 වැනි සිකුරාදා පස්වරු 2.30 ටය. ටැන්ඩර් පත්‍ර විවෘත කරන විට ටැන්ඩර් ඉල්ලුම්කරුවන්ට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ. ටැන්ඩර් පත්‍ර විවෘත කරන නිලධාරි තැන විසින් පැමිණ සිටින ටැන්ඩර් ඉල්ලුම්කරුවන්ට ටැන්ඩර් ඉල්ලුම් කරුවන්ගේ නම් සහ ප්‍රමාණයන් කියවනු ලැබේ.

8. ටැන්ඩර් ඉල්ලුම් කරුවන් ටැන්ඩර් භාරගන්නා අවසාන දින සිට සති හයක් යනතුරු ඔවුන්ගේ ඉල්ලීම් විවෘතව තබාගෙන සිටිය යුතුය.

9. ටැන්ඩර් ලියකියවිලි ආදිය පරීක්ෂා කළ හැකි මඩකලපුවේ නැගෙනහිර පළාතේ අධ්‍යාපන කායාලයෙන් වැඩි විස්තර දැන ගැනීමට පුළුවන.

10. ටැන්ඩරය ලබාගන්නා තැනැත්තා විසින් සේවයේ යොදවනු ලබන සියලුම සේවකයන් ලාංකිකයන් වියයුතුවා පමණක් නොව ඔවුන්, වැඩ කෙරෙන ප්‍රදෙශයෙන්ම, තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. ලාංකික වූ හා වැඩ කෙරෙන ප්‍රදෙශයෙහි වූ සේවකයන් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාගේ හා අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගේ අනුමැතිය හා අවසරය නැතිව එකී කොන්දේසිය කඩකිරීම කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු වීමට හේතු වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩ කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයන් වැඩෙහි යෙදවීම තහනම්ය.

සී. තනිකාසලම්,
වැඩබලන අධ්‍යාපන නිලධාරිතැන.

අධ්‍යාපන කායාලය, මඩකලපුව,
1959 ජනවාරි 30 දින.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

මෙහි පහත සඳහන් වැඩ වෙනුවෙන් ටැන්ඩර් පත්‍ර මඩකලපුවේ අධ්‍යාපන කායාලයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 පෙබරවාරි 27 වැනි සිකුරාදා පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩෙහි විස්තර |
|---|---|
| ටී/තෝප්පූර් රජයේ මුස්ලිම් ගැහැණු පාසල ... | සම්පූර්ණ අළුත්වැඩියා කිරීම් |
| ටී/තිරිකුණාමලේ රජයේ මුස්ලිම් ගැහැණු පාසල ... | සම්පූර්ණ අළුත්වැඩියා කිරීම් |
| ටී/ඊච්චන් දිවු රජයේ දෙමළ මිශ්‍ර පාසල ... | සම්පූර්ණ අළුත්වැඩියා කිරීම් |
| ටී/ගොමරන්කඩවල සිංහල මිශ්‍ර පාසල ... | සම්පූර්ණ අළුත්වැඩියා කිරීම් |
| බීටී/අට්ටාලචේන උතුර, රජයේ මුස්ලිම් මිශ්‍ර පාසල ... | සම්පූර්ණ අළුත්වැඩියා කිරීම් |
| බීටී/පනන්කාඩු රජයේ දෙමළ මිශ්‍ර පාසල ... | සම්පූර්ණ අළුත්වැඩියා කිරීම් |

සංලක්ෂ්‍යය : බීටී=මඩකලපු දිස්ත්‍රික්කය
ටී=තිරිකුණාමල දිස්ත්‍රික්කය

2. ටැන්ඩර් ෆෝර්ම 1959 පෙබරවාරි 26 වැනි දින පස්වරු 3.30 දක්වා ලබාගත හැකිය.

රුපියල් 7,500කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද එසේ නැතහොත් රුපියල් 15,000කට හෝ ඊට වැඩි ගණනකට ප්‍රසිධ වැඩ දෙපාර්තමේන්තුවේද ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අය විසින් එක් එක් වැඩය සඳහා රු. 100ක් අධ්‍යාපන දෙපාතීමේන්තුවේ (ඒසී ශාඛාවේ) හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට රිසිට් පතක් නැගෙනහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තුමන් වෙත ඉදිරිපත් කළ විට ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. චැක්පත් මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් ආදිය භාර නොගනු ලැබේ.

3. දැනටමත් රජයේ කොන්ත්‍රාත් වැඩ භාරගෙන ඒවායේ යෙදී සිටින ටෙන්ඩර් කරුවන් ඒ වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට එකී වැඩ කටයුතු භාර නිලධාරීන් ගෙන් ලබාගත සහතිකයක් ටැන්ඩර් ෆෝර්ම ඉල්ලීමේදී ඉදිරිපත් කළ යුතුයි.

සහතික පත්‍රය තිබිය යුත්තේ පහත පෙනෙන ෆෝර්මයේ අන්දමටය.

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ මුදල | කොන්ත්‍රාත්තුවේ දිනය | සම්පූර්ණ කළයුතු නියමිත දිනය (කල්දී තිබේද යන වග) | වැඩ කරගෙන යන අන්දම සතුටුදයකද නැද්ද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ අත්සන සහ තනතුර |
|---|---|---|---|---|---|

ඉහත සඳහන් වන්නේ මා භාරගෙන තිබෙන රජයේ සියලුම කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සම්පූර්ණ සටහනයි.

## ලංකා ගමනාගමන මණ්ඩලය

මීතොටමුල්ලේ දිස්ත්‍රික්ක ගරාජය උදෙසා පහත පෙනෙන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර පත්‍ර එවන ලෙස කොළඹ 5 නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ :—

(අ) ඉංජිනේරු කායශීලයවල් ;

(ආ) සර්විස් කරන වළවල් ;

(ඇ) ධාවන (ඔපරේෂන්ස්) කායශීලය ;

(ඈ) ධාවන කායශීලයේ ආපණ ශාලාව, විශ්‍රාම කාමරය ආදිය.

මේ සඳහා ටෙන්ඩර පත්‍ර එවීමට සුදුසු වන්නෝ නම් රු. 2,00,000ක් හෝ ඊට වැඩියෙන් සිවිල් කර්මාන්ත සඳහා ලියාපදිංචි කරනු ලැබූ ආණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවෝ පමණකි.

මේ සඳහා ටෙන්ඩර පත්‍ර එවීමට බලාපොරොත්තුවන ටෙන්ඩරකරුවන් විසින් තම සහතික පත්‍ර ආදිය, බොරලැස්ගමුවේ වේරහැර වූ මධ්‍යම වැඩපොළෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය සිවිල් ඉංජිනේරු මහතා ලවා පරීක්‍ෂා කරවාගෙන, ඉන් පසු කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රු. 200 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ලබාගත යුතුයි.

මේ කුවිතාන්සිය ඉදිරිපත් කළ විට 1959 යේ පෙබරවාරි මස 14 වෙනිද වන සෙනසුරාද දවල් 12 වන තෙක් සිවිල් ඉංජිනේරු මහතා විසින් ටෙන්ඩර ලිපි දෙනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර බාරගැනීම 1959යේ පෙබරවාරි මස 18 වෙනිද වන බදාදා පෙ. ව. 10ට නවත්වනු ලැබේ.

සියලු ටෙන්ඩර පත්‍ර ලිවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන ෆෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන.

1959යේ ජනවාරි මස 28 වෙනි දින,
කොළඹදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

බස් බොඩි ඉස්සීම පිණිස මෝබයිල් ක්‍රේන් එකක් සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර නාරාහේන්පිට කිරුළ පාරෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959 යේ මාර්තු මස 25 වෙනිද වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර නියමිත ෆෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්තකොට එවිය යුතුයි. මේ ෆෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කායශීලයෙන් 1959යේ මාර්තු මස 24 වෙනිද වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. එවා දෙන්නේ රු. 50ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විටය.

3. ප්‍රධාන සම්පාදක නිලධාරි කායශීලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන.

1959යේ ජනවාරි මස 27 වෙනි දින,
කොළඹදීය.

---

## ටෙන්ඩර් දැන්වීම අවලංගු කිරීමයි

### මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මැනුම් පිටි 400ක් ද, ලඹ කකුල් 250ක් හා කොමෝඩ් 12ක් ද සැපයීම සඳහා 23.1.59 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් දැන්වීම අවලංගු කළ බව මහජනයා වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

වී. රාසරේවනම්,
සර්වේයර් ජනරාල්.

## රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ කුරුවිට සහ නැඳුරන යන ගම්වල ඉඩම් සංවර්ධන ඕවර් සියර් වරුන්ගේ පදිංචිය සඳහා නිවාස දෙකක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාස දෙකක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 3 වන දින උදේ 10 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඬ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 5,000 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

2. ටැන්ඩර් ෆෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් ෆෝරම 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 7 වන දින උදේ 10 ට රත්නපුර කච්චේරියේ දී සිදු කරනු ඇත.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1959 ජනවාරි මස 29 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දීය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ බලවින්න සහ අටකලන්පන්න යන ගම්වල ඉඩම් සංවර්ධන ඕවර් සියර් වරුන්ගේ පදිංචිය සඳහා නිවාස දෙකක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාස දෙකක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 3 වන දින උදේ 10 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඬ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 5,000 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

2. ටැන්ඩර් ෆෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් ෆෝරම 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 7 වන දින උදේ 10 ට රත්නපුර කච්චේරියේ දී සිදු කරනු ඇත.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1959 ජනවාරි මස 29 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දීය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ ඇඹිලිපිටිය සහ කැල්ල යන ගම්වල ඉඩම් සංවර්ධන ඕවර් සියර් වරුන්ගේ පදිංචිය සඳහා නිවාස දෙකක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාස දෙකක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මාරතු මස 3 වන දින උදේ 10 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඬ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 5,000 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

2. ටැන්ඩර් ෆෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් ෆෝරම 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 7 වන දින උදේ 10 ට රත්නපුර කච්චේරියේ දී සිදු කරනු ඇත.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1959 ජනවාරි මස 29 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දීය.

## රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරළේ වේවැල්කඳුර යන ගමේ ඉඩම් සංවර්ධන ඕවර් සියර් වරුන්ගේ පදිංචිය සඳහා නිවාස එකක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාසයක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 3 වන දින උදේ 10 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 3,000 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

2. ටැන්ඩර් පෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රුපියල් 30 ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් පෝරම 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබා ගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 7 වන දින උදේ 10 ට රත්නපුර කච්චේරියේ දී සිදු කරනු ඇත.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1959 ජනවාරි මස 29 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දිය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩවත—මැද කෝරළේ ඇල්ලෙඅරාවේ යන ගමේ ඉඩම් සංවර්ධන ඕවර් සියර් වරුන්ගේ පදිංචිය සඳහා නිවාස එකක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාසයක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 3 වන දින උදේ 10 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 3,000 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

2. ටැන්ඩර් පෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රුපියල් 30 ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් පෝරම 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබා ගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 7 වන දින උදේ 10 ට රත්නපුර කච්චේරියේ දී සිදු කරනු ඇත.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1959 ජනවාරි මස 29 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දිය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මාරපන යන ගමේ ඉඩම් සංවර්ධන ඕවර් සියර් වරුන්ගේ පදිංචිය සඳහා නිවාස එකක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ඉහත සඳහන් නිවාසයක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 3 වන දින උදේ 10 දක්වා භාර ගනු ලැබේ. ටැන්ඩර් කරුවන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ රුපියල් 3,000 කට වැඩි වටිනාකම ඇති වැඩ කිරීම සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් විය යුතුයි.

2. ටැන්ඩර් පෝරම ලබාගැනීමට පෙර කච්චේරියේ රුපියල් 30 ක මුදලක් තැන්පත් කොට එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුය.

3. ටැන්ඩර් පෝරම 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබා ගත හැක. ටැන්ඩර් පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 7 වන දින උදේ 10 ට රත්නපුර කච්චේරියේ දී සිදු කරනු ඇත.

4. මේ පිළිබඳ තවත් අවශ්‍ය කරුණු 1959 මාර්තු මස 2 වන දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි තැන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1959 ජනවාරි මස 29 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දිය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

උතුරු කොළඹ දිස්ත්‍රික්කයේ මාබිම-මාකොළ පාරේ පලවෙනි හැතැප්ම පලවෙනි සැතපුම් භාගය පලල් කර අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959යේ පෙබරවාරි මස 25 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ උතුරු කොටස භාර විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959යේ පෙබරවාරි මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ජේ. ඩබ්ලිව්. ද අල්විස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදිය. 59.2.2.

---

සීදූවේ නිවාස දෙකක් ගොඩනැගීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959යේ මාර්තු මස 4 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මීගමුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959යේ පෙබරවාරි මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 45,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රා කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. පේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදිය. 59.2.2.

මැදවච්චියේ කනිටු පාසැලේ ගොඩනැගිල්ල ග්‍රාම සංවර්ධන මධ්‍ය ස්ථානයකට පරිවර්තනය කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, වරාන් ස්වර්ක්ස් හවුස් හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 මාර්තු මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුරේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ පෙබරවාරි මස 25 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 64,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය. 59.2.2.

---

කටුගස්තොට දිස්ත්‍රික්කයේ නාරම්පනාව-දියරබෙදුනැන්න පාරේ තැන්නේ ඔය හරහා අඩි 48ක් පළල ඇති පාලමක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, වරාන්ස්වර්ක් ස් හවුස් හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 මාර්තු මස 11 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කටුගස්තොට ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 පෙබරවාරි මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ "සී" කොටස යටතේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ජේ. ඩබ්ලිව්. ද අල්විස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවටය.

කාර්යාලයේදීය, 59.2.2.
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,

මාරාවිල වීරසේනේ බාලිකාවන්ගේ ගොවි පාසැලක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, වරාන්ස්වර්ක්ස් හවුස් හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මාර්තු මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හලාවත ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙනැ ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ පෙබරවාරි මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ "ඒ", බී සහ සී යන කොටස් යටතේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේ දීය, 59.2.2.

---

# බඩු බාහිරාදිය විකිණීම

කපා ඉතුරු වූ පාවිච්චි කළ හැකි කඩදාසි කැබලි රාත්තල් 1,000ක් පමණ තොගයක් 1959 පෙබරවාරි මස 19 වැනි දින පස්වරු 2ට කොම්පඤ්ඤ වීථියේ මැලේ වීදියේ පිහිටි විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයෙහි වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසන් වූ වහාම මුදල් ගෙවා කඩදාසි ඉවත් කර ගත යුතුයි.

වෙන්දේසිය පවත්වනු ලබන දින උදේ 9යේ සිට ඉහත කී ස්ථානයේදී ඒ කඩදාසි බැලිය හැක.

එල්. එල්. කේ. ගුණතුංග,
විභාග කොමසාරිස්.

1959ක් වූ පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේදීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත **සම්පූර්ණ** ගාස්තුවක් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරිම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955** ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| කනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ **මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී